සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/14/SS/2/VII/3/2025-2
ඔබේ අංකය / உமது இல / Your No: ..........................................
දිනය / திகதி / Date: 2025.09.12

**සමෘද්ධි චක්‍රලේඛ අංක :- 2025/11 - සංශෝධන**

සියළුම / දිස්ත්‍රික් ලේකම්වරු/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරු,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,

සියළුම නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂවරුන් /සහකාර සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම සමෘද්ධි කළමණාකරුවන්,

සියළුම විෂය භාර නිලධාරින් / සමෘද්ධි සංවර්ධන නිලධාරින්,

**සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල යටතේ "සමෘද්ධි සිප්දොර" ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරිම - 2025-2027**

උක්ත මැයෙන් ඔබ වෙත යොමු කරන ලද සමෘද්ධි චක්‍රලේඛ අංක -2025/11 හා 2025.09.02 දිනැති චක්‍රලේඛය හා බැදේ.

02. එම චක්‍රලේඛයේ පහත සංශෝධන ඇතුලත් කර ගනිමින් ඉදිරි කටයුතු සිදු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

3.0 අවශ්‍ය සුදුසුකම් - ඡේදය යටතේ පහත 3.4, සහ 3.5,සහ 3.6 ඡේද ඇතුලත් කරනු ලැබේ.

3.4. 3.1,3.2, සහ 3.3 සුදුසුකම් සපුරාලන එකම පවුලේ නිවුන් දරුවන්ට මෙන්ම කිසියම් හේතුවක් මත උසස් පෙළ හැදෑරීම සඳහා එකවර ඇතුළත් වන එකම පවුලේ දරුවන් කිපදෙනෙකුට හෝ දෙමව්පියන් අහිමිව භාරකරුවන් යටතේ සිටින දරුවන්ට මෙම සිප්දොර ශිෂ්‍යත්වය හිමි වේ.

3.5 සමෘද්ධි ප්‍රතිලාභ ලබමින් සිට අස්වැසුම ප්‍රතිලාභ සඳහා හිමිකම් ලද මුත් මේ අවස්ථාව වන විට අස්වැසුම ප්‍රතිලාභ වැඩසටහනෙන් ඉවත් කර ඇති පවුල් වල උසස් පෙළ හදාරන දරුවන් වෙනුවෙන් මෙම සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කිරීමට නියමිත වේ. භාරකාර මණ්ඩලය විසින් ලබාදෙන අනුමැතීන් අනුව අවශ්‍ය උපදෙස් ඉදිරියේදි ලබා දෙන අතර, දැනට ඔවුන් වෙනුවෙන් මෙම සිප්දොර ශිෂ්‍යත්ව ප්‍රතිලාභ වැඩසටහන ක්‍රියාත්මක කරනු නොලැබේ.

1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |

3.6.කුමන හෝ රාජ්‍ය ආයතනයක ශිෂ්‍යාධාර නොලබන සිසුවකු විය යුතුය.

3.7.රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ශිෂ්‍යත්ව වැඩසටහන් හෝ ජනාධිපති අරමුදල මගින් ක්‍රියාත්මක කරනු ලබන ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ප්‍රතිලාභ හිමි සිසුවකු වීම.

4-2. ඡේදය

"මේ සමඟ අමුණා ඇති ඇමුණුම -A ආකෘතිය අනුව සකසාගත් අයදුම්පත්‍රය අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර, අදාල පාසලේ විදුහල්පතිගේ සහතිකය සමඟ සමෘද්ධි සංවර්ධන නිලධාරි හා සමෘද්ධි බැංකු කළමණාකරුගේ නිර්දේශ සහ අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මූලස්ථාන කළමණාකරුගේ නිර්දේශය සහිතව ප්‍රාදේශිය ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කල යුතුය."

<u>සංශෝධනය</u>

4.2. "මේ සමඟ අමුණා ඇති ඇමුණුම - A ආකෘතිය අනුව සකසාගත් අයදුම්පත්‍රය අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර, අදාල පාසලේ විදුහල්පතිගේ සහතිකය සමඟ සමෘද්ධි සංවර්ධන නිලධාරි හා සමෘද්ධි බැංකු කළමණාකරුගේ නිර්දේශ සහ අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මූලස්ථාන කළමණාකරුගේ නිර්දේශය සහිතව ප්‍රාදේශිය ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කල යුතුය. සිසුන් ලියාපදිංචි කිරීමේදී විදුහල්පතිගෙන් සහතික කර ගත යුතු අතර, අනතුරුව මාස 06 කට වරක් අදාළ සිසුන් අ.පො.ස.(උ.පෙළ) අධ්‍යාපනය හදාරන බව හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටින බවට තහවුරුවක් ලබා ගැනීම ප්‍රමාණවත් වේ."

6.1. ඡේදය "දිස්ත්‍රික් මට්ටමින් ගෙන්වා ගන්නා වාර්තා පදනම් කොට ගෙන සෑම මසකම තුන්වන සතිය තුල එම මාසයට අදාල වාරික මුදල් බැංකු වෙත ප්‍රේෂණය කරනු ලබන අතර වාරික 24ක උපරිමය දක්වා ප්‍රතිලාභ ගෙවීම සිදු කරනු ලබයි."

<u>සංශෝධනය</u>

6.1. "දිස්ත්‍රික් මට්ටමින් ගෙන්වා ගන්නා වාර්තා පදනම් කොට ගෙන සෑම මසකම තුන්වන සතිය තුල එම මාසයට අදාල වාරික මුදල් බැංකු වෙත ප්‍රේෂණය කරනු ලබන අතර වාරික 24ක උපරිමය දක්වා මාසික වාරිකය රු. 1500/= බැගින් ප්‍රතිලාභ ගෙවීම සිදුකරනු ලැබේ."

7-1 ඡේදය "මෘදුකාංග පද්ධතිය හරහා බැංකු වාර්තා පද්ධතියට (MIS Reporting) පිවිසීමට පහත නිලධාරින් වෙත අවසරය ලබාදී ඇත.

7-1.1. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - සමාජ ආරක්ෂණ විෂයභාර සමෘද්ධි සංවර්ධන නිලධාරි හෝ ප්‍රාදේශිය ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියකු

7-1.2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - සමාජ ආරක්ෂණ විෂයභාර සමෘද්ධි සංවර්ධන නිලධාරියා හෝ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නිලධාරියා

7-1.3. ප්‍රධාන කාර්යාලය - අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ හා සුභ සාධන) හෝ අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලබන නිලධාරියා"

**<u>සංශෝධනය</u>**

7-1 " මෘදුකාංග පද්ධතිය හරහා බැංකු වාර්තා පද්ධතියට (MIS Reporting) පිවිසීමට අවසර ලබාදෙන නිලධාරින් සම්බන්ධයෙන් ඉදිරියේදි දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය මඟින් මීට අදාලව නිකුත් කරනු ලබන චක්‍රලේඛ මඟින් උපදෙස් ලබා දෙනු ඇත.

සී.ඩී. කළුආරච්චි

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. අධ්‍යක්ෂ, (ක්ෂුද්‍ර මූල්‍ය), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
3. සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස./දැ.ගැ.ස.
5. අනෙකුත් සියළුම අංශ ප්‍රධානීන් - දැ.ගැ.ස